# කඩදාසි බූමරැංගුවක් පියාවඹමු!

ඕසකා ආර්ථිකවිද්‍යා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය නිෂියමා යුතකා
nishiyama@osaka-ue.ac.jp

## සාදන ක්‍රමය

(1) සණකම් චිත්‍රකොලයක් සූදානම් කරන්න. විවිධ වර්ගයේ නම් වලින් සණකම් කොල වර්ග පොත්සැල් වල විකිණීමට ඇත .
(2) සණකම් චිත්‍රකොලය යටින්ම තබා ඊට උඩින් කාබන් කොලය තබා උඩින්ම බ්ලොක් එක තබන්න.
(3) බ්ලොක් එකේ රේඛාව දිගේ පෑනෙන් බූමරැංගුවේ හැඩය ඇඳගන්න තිත් රේඛාවකින් මාජින් එක අඳින එක අමතක කරන්න එපා.
(4) හොඳපිට කණපිට තේරෙන විදිහට හොඳපැත්තෙ සලකුණක් කර තබන්න.
(5) සණකම් චිත්‍රකොලය ප්‍රවේශමෙන් කතුරෙන් කපා ඉවත්කරගන්න.
(6) මේසය උඩ තබ දිගහරින්න.
(7) නමන්න පහසු වෙන විදිහට තිත් රේඛාව දිගේ පෑනෙන් තදින් ඉරි දෙතුන් පාරක් අඳින්න.
(8) ඒ ඒ පියාපත් කන්දක හැඩයට නමන්න නැම්ම අංශක 10 සිට 30 දක්වා.

## පියාඹවන විදිහ

(1) මතුපිට පැත්ත මූහුණ පැත්තට හැරෙන ආකාරයට පියාපතේ තුඩ මහපට ඇගිල්ල සහ දබර ඇගිල්ලෙන් අල්ලගන්න.
(2) පියාපත පොළව හා සෘජුව සිටින සේ තබන්න.
(3) අතේ මැණික් කටුවට ශක්තිය දී කැරකීම වැඩිවෙන විදිහට හසුරුවන්න.
(4) උඩපැත්තට නොව ඇස් මට්ටමට ගෙන තල්ලුවෙන විදිහට (dart = ශරය විසිකරන ආකාරයට) විසිකරන්න.






(1) (කන්දක් ) විදිහට නමනවා අංශක 10 සිට 30 දක්වා.



(2) පියාපතේ තුඩ පොඩ්ඩක් උඩට නමනවා.






# කාටවුනත් පුළුවන්!

# උත්සාහකරලා බලමු!

## පියාඹන විදිහ

ඇස් මට්ටමෙන් වම්පැත්තට කැරකිලා (උඩ සිට බලන විට ඔර්ලෝසුව විරුද්ධ පැත්තට කැරකෙන ආකාරයට) ආපසු එනවා.
(වම් අතින් විසිකලොත් දකුණු පැත්තට කැරකෙනවා)
පියාඹන දුර මීටර් 3 සිට මීටර් 4 දක්වා පියාඹන කාලය තත්පර 1 සිට තත්පර 2 දක්වා.

## අල්ලන විදිහ

බූමරැංගුව සමතලාව තිරස්ව එන බැවින් අත් දෙක සෙන්ටි මීටර් 30ක් පමණ දිගාහැර ඉක්මනින අල්ලගන්න.

## අවවාදයයි!

මුහුණ ආදියෙහි වැදීම අනතුරුදායක බැවින් වටපිට කවුරු හෝ ඉන්නවාද නැද්ද කියා පරීක්ෂා කර බලන්න.

# බූමරෑංගූව ආපසු එන්නේ ඇයි?

බූමරෑංගූව කැරකෙමින් ඉදිරියට ගමන් කරයි. සුළගට මුහුණ දෙන උඩ පියාපතේ වේගය වැඩිවන නමුත් යට පියාපතේ වේගය අඩුවෙයි. වේගයේ වෙනස පාවෙන ශක්තියේ වෙනස වෙයි. මෙම පාවෙන ශක්තියේ වෙනස අනුව බූමරෑංගූවට උඩ තුඩේ කොටස වම් පැත්තට කැරකවීමේ බලය ඒ කියන්නෙ ඔර්ලෝසුවෙ විරුද්ධ පැත්තට කරකවන බලය ලබා දෙනවා. මෙම කැරකීමේ ශක්තිය Torque කියලා කියනවා.

නමුත් බූමරෑංගූව භ්‍රමණ කේන්ද්‍රයට උදව්වක් කිරීමේ බලාපොරොතතුවෙන් පැත්ත වම් පැත්තට මාරු කරනවා.පාවෙන ශක්තියට අනුව වැටෙන්න යනවා, පැත්ත මාරුකරනවා, වැටෙන්න යනවා, පැත්ත මාරුකරනවා යන සිද්ධිය නොනැවතී ඇතිවෙන නිසා එහි ප්‍රථිඵලයක් හැටියට බූමරෑංගූව වම් පැත්තට කැරකෙමින් ආපහු එයි .මෙය කැරකෙන බඹරයක් වැටෙන්න යනවිට නොවැටෙන විදිහට දරණ උත්සාහය හා සමානයි. එමෙන්ම බෙල්ල කැරකවීමේ ව්‍යායාමය හා සමාන නිසා පරතර ව්‍යායාමය කියලා කියනවා.




රූපසටහන 1 වම්පැත්තට කැරකීම පැහැදිලි කිරීම




රූපසටහන 2 දකුණු අතේ නීතිය

# බූමරෑං සංගමයේ හෝම් පේජ්

ජපන් බූමරෑං සංගමය (JBA) http://www.jba-hp.jp/

කන්සයි බූමරෑං නෙට් වර්ක් (KBN) http://www.kbn3.com/

ඇමරිකා බූමරෑං සංගමය (USBA) http://www.usba.org/